(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 9(7).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2013 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා

## 2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4077/'13

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ යල කන්නයේදී ඇති වූ නියඟය හේතුවෙන් කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ වී වගාවට සිදු වූ හානිය කොපමණද;

(ii) වී වගාවට සිදුවූ ඉහත හානි වෙනුවෙන් මෙතෙක් ගොවීන්ට සහනාධාර ලබා නොදීමට හේතු කවරේද;

(iii) 2012-2013 වකවානුව තුළ මහ කන්නයේදී ගංවතුර හේතුවෙන් කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ හානියට පත්වූ කුඹුරු ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iv) එම ගංවතුර නිසා ගොවීන්ට සිදුවූ හානිය කොපමණද;

(v) එම ගොවි ජනතාවගේ වී වගාවන්ට සිදුවූ ඉහත හානිය වෙනුවෙන් මෙතෙක් සහනාධාර ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4159/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය සඳහා මහපොළ ශිෂ්‍යත්ව අරමුදලින් ප්‍රතිලාභ ලබන විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු සඳහා ලබාදෙන මහපොළ ශිෂ්‍යත්ව මාසික වාරිකයේ වටිනාකම කොපමණද;

(iii) වර්ෂ හයකට වැඩි කාලයක් තුළ ඉහළ දමා නොමැති වත්මන් ශිෂ්‍යත්ව මාසික වාරික මුදල පවතින භාණ්ඩ හා සේවා මිල ගණන්වලට සාපේක්ෂව විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, වර්තමාන භාණ්ඩ හා සේවා මිල ගණන් සහ ශිෂ්‍යත්ව වාරිකය ඉහළ නොදැමූ කාලය යන කරුණු සැලකිල්ලට ගෙන එම දීමනාව අවම වශයෙන් රුපියල් පන්දහසක් (රු. 5000/=) දක්වා වැඩිකිරීමට අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4213/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 සහ 2012 යන වර්ෂවලදී රජයේ රෝහල් සඳහා ආහාරපාන සපයන ලද ලියාපදිංචි සැපයුම්කරුවන් කවුරුන්ද;

(ii) එකී සැපයුම්කරුවන් වෙනුවෙන් එම එක් එක් වර්ෂය සඳහා ගෙවිය යුතු වූ මුළු මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට ගෙවා අවසන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය එම එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වර්ෂ තුන තුළ රජයේ රෝහල් සඳහා ආහාරපාන සැපයූ සැපයුම්කරුවන් එම හිඟ මුදල් නොලැබීම හේතුවෙන් දැඩි දුෂ්කරතාවයට පත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම හිඟ මුදල් ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම හිඟ මුදල් ගෙවා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4322/'13

ගරු ජෝන් අමරතුංග මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළු ඇල කැපීමේ ව්‍යාපෘතිය යටතේ වැලිසර වෙඩිබෙහෙත් ගබඩාව ආසන්නයේ, හොරපෙ දුම්රියපොළ දිසාවට මීටර් 200කින් පමණ නියමිත මාර්ගය වෙනස් කර ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඇලක් හාරමින් තිබේද;

(ii) එම ඇලේ නියමිත මාර්ගය වෙනස් කරනු ලබන්නේ වෙඩිබෙහෙත් ගබඩාවේ ආරක්ෂාව උදෙසා නාවික හමුදාව විසින් කළ ඉල්ලීමක් හේතුවෙන්ද;

(iii) එම ඇල මාර්ගය පෞද්ගලික කුඹුරු ඉඩම් හරහා හාරනු ලබන බැවින් එම කුඹුරු ඉඩම් හිමියන්ට වන්දි මුදලක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4331/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1956 වර්ෂයේදී බැංකු සේවකයින්ට ප්‍රදානය කරන ලද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ, 1972 දී සමගි පෙරමුණ රජය විසින් අහෝසි කර නැවත 1977 දී යළි ස්ථාපිත කරනු ලැබ 1996 දී යළිත් වරක් පොදු පෙරමුණ රජය විසින්ම අහෝසි කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1996 ජනවාරි 01 දිනට පසු බඳවාගත් රාජ්‍ය බැංකු සේවකයින්ට 2009 ජනවාරි 01 දින සිට විශ්‍රාම වැටුප් හිමිකම ලබාදෙන බවට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා කර ඇති ප්‍රකාශය පරිදි එම සේවකයින්ට එකී ප්‍රතිලාභය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඉහත පරිදි විශ්‍රාම ප්‍රතිලාභ ලබාදී නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ඒ ඒ රාජ්‍ය බැංකුවලට දැරිය හැකි විශ්‍රාම ක්‍රමයක් ස්ථාපිත කිරීමට 2011.05.19 දින ලිඛිතව උපදෙස් ලබාදී තිබේද;

(ii) බැංකු නිලධාරීන් විසින් එම නියෝගය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iii) ලංකා බැංකුවේ කළමනාකාරීත්වයේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර භාණ්ඩාගාර ලේකම්වරයාට යොමු කරන ලද 2012.05.23 දිනැති විශ්‍රාම වැටුප් යෝජනාව මෙතෙක් අනුමත නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා)

3736/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය, ක්‍රිස්ටෝපර් පාර, අංක 124 ඕ දරන ස්ථානයේ පදිංචි, එච්. එල්. ප්‍රේමචන්ද්‍ර මහතා, (සේවා අංක 1060814) ලංකා බැංකුවේ කඳපොල ශාඛාවේ විධායක නිලධාරි තනතුරේ සේවයේ නියුතුව සිටියදී, යම් චෝදනාවක් මත 2000.04.18 දින සේවය අත්හිටුවා, චෝදනාවන් ඔප්පු කිරීමට අපොහොසත්වීමේ හේතුව මත 2001.05.14 දින සිට නැවත සේවයේ පිහිටුවා සිටින අයෙකු බවත්;

(ii) 2010.03.09 දින සිට 2010.05.16 දින දක්වා ඔහු රාජකාරි නිවාඩු මත නිදහස් කරනු ලැබ සිට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ලංකා බැංකුව, පේරාදෙණිය ශාඛාවේ දැනට කණිෂ්ඨ විධායක නිලධාරී ධූරය දරන ප්‍රේමචන්ද්‍ර මහතාට 2000 වර්ෂයට පෙර පැවැති විධායක නිලධාරී සේවා තත්ත්වය සැලකිල්ලට ගනිමින් හිඟ වැටුප් ඇතුළු අනෙකුත් සේවක අයිතීන් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4078/'13

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ජාත්‍යන්තර තත්ත්වයේ ක්‍රීඩාංගණයක් ඉදිකරනු ලබන්නේද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා මුදල් ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(v) මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල කොපමණද;

(vi) එම ක්‍රීඩාංගණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4306/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටෙහි ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙරටෙහි තිබෙන, එම්. ආර්. අයි (MRI) ස්කෑනර් යන්ත්‍ර සහිත රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම්. ආර්. අයි. (MRI) ස්කෑනර් යන්ත්‍ර සහිත රජයේ රෝහල්වල නම් සහ ඉහත කී එක් එක් රෝහල සතු එම් ආර්. අයි. (MRI) ස්කෑනර් යන්ත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෛනික පදනම මත, රජයේ රෝහල්වල එම්. ආර්. අයි. (MRI) ස්කෑනර් යන්ත්‍ර ප්‍රයෝජනවත් වන රෝගීන්ගේ සාමාන්‍ය ගණන කවරේද;

(ii) රජයේ රෝහල් සතුව පවත්නා එම්. ආර්. අයි. (MRI) ස්කෑනර් යන්ත්‍ර ප්‍රමාණය එම යන්ත්‍රයට ඇති ඉල්ලුම සපුරාලීම පිණිස ප්‍රමාණවත් වන්නේද;

(iii) නොඑසේ නම්, එම්. ආර්. අයි. (MRI) ස්කෑනර් පරීක්ෂාවන් ලබා ගැනීමට රෝගීන්ට ඇති විකල්ප ක්‍රම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4339/'13

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 වර්ෂයේදී ලබාදුන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය අනුව මහල් රථගාලක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට පවරන ලද කොළඹ කොටුව වැතම් වීදියෙහි පිහිටි පර්චස් 95ක් පමණ වූ ඉඩමේ එකී රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය එම අධිකාරිය විසින් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම ඉඩම සවුත් ඊස්ට් ඒෂියා කන්ස්ට්‍රක්ෂන් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති ආයතනය වෙත මුලින් බදු දීමක් සිදුකොට පසුව ඔවුන් වෙත සින්නක්කරව විකිණීමේ නීත්‍යානුකූලභාවයක් තිබේද;

(iii) මේ දක්වා කිසිදු සංවර්ධනයකට යොදා ගෙන නොමැති එම ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4415/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය නගරවාසීන් තම පානීය ජල අවශ්‍යතාවයන් සපුරා ගැනීමේදී දැඩි දුෂ්කරතාවයකට මුහුන පා සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම දුෂ්කරතාවයන් මගහරවා ගැනීම සඳහා කඩිනමින් ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගෙන තිබේද;

(iii) එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) කුලියාපිටිය නගරවාසීන්ට පානීය ජලය සැපයීම සඳහා යොදාගත හැකි බවට හඳුනාගෙන ඇති ජල මූලාශ්‍රයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4430/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාන්පිටිවලින් සෑදූ ආහාර වර්ග සහ පැණි බීම වර්ග පාසල් ආපනශාලා තුළ විකිණීම තහනම් කරමින් 2011 වර්ෂයේදී චක්‍රලේඛයක් නිකුත් කර තිබේද;

(ii) එම චක්‍රලේඛය මේ වන විටත් වලංගුව පවතින්නේද;

(iii) සියලුම පාසල් මේ වනවිට එම චක්‍රලේඛයට අනුව ක්‍රියාත්මකවේද;

(iv) එම චක්‍රලේඛයට අනුව කටයුතු නොකළ පාසල් තිබේ නම්, එම පාසල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි දුෂ්කර පාසල් සඳහා දිවා ආහාරය ලබාදීමේ වැඩ පිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක වන පාසල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4161/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන් සහ ජනාධිපති උපදේශකවරුන් පත්කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

(ii) එම තනතුරු සඳහා පත් කිරීමේදී සලකා බලන අවම අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4308/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනුම සඳහා අධ්‍යාපනය සමාජය ව්‍යාපෘතිය (EKSP) යටතේ පාසල්වලට පරිගණක බෙදා දෙනු ලැබුවේද;

(ii) එසේ නම්, ඉහත ව්‍යාපෘතිය යටතේ පරිගණක බෙදා දෙනු ලැබූ පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිට දැනුම සඳහා අධ්‍යාපනය සමාජය ව්‍යාපෘතිය (EKSP) යටතේ මිලදී ගන්නා ලද පරිගණක සංඛ්‍යාව කොපමණද;

(ii) පරිගණක මිලදීගැනීම පිණිස කොන්ත්‍රාත් ප්‍රදානය කළ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(iii) ප්‍රදානය කළ එක් එක් කොන්ත්‍රාත්තුව යටතේ මිලදී ගන්නා ලද පරිගණක සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රදානය කළ එක් එක් කොන්ත්‍රාත්තුව යටතේ සැපයුම්කරුට / සැපයුම්කරුවන්ට මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දැනුම සඳහා අධ්‍යාපනය සමාජය ව්‍යාපෘතිය (EKSP) යටතේ පරිගණක මිලදී ගැනීම පිණිස සැපයුම්කරුවන් තෝරා ගැනීමට වගකිවයුතු ආයතනය කවරේද;

(ii) තෝරාගැනීම් ක්‍රියාවලියේදී සැපයුම්කරුවන් ඇගයීමට යොදාගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) තෝරාගත් සැපයුම්කරුවන් තෝරාගැනීම් ක්‍රියාවලියේදී නියම කොට තිබූ නිර්ණායක සපුරන ලද්දේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4342/'13

ගරු කරු ජයසූරිය මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරන පුද්ගලයින්ගේ දුරකථන සංවාදවලට රහසින් සවන්දීමේ නියැළී සිටින්නේද;

(ii) එසේ නම්, ඉහත කී පරිදි කවර පුද්ගලයින්ගේ දුරකථන සංවාදවලට රහසින් සවන් දෙන්නේද;

(iii) එකී පුද්ගලයින්ගේ දුරකථන සංවාදවලට රහසින් සවන්දීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4417/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ මූලික සැලසුමට අයත්ව තිබූ ඩෙවොන්, සෙන්ට් ඇන්ඩෲස්, පූඩළු ඔය, පූනා ඔය සහ රම්බොඩ යන ජල මූලාශ්‍රයන් වැඩ අවසන්ව ඇති එකී ව්‍යාපෘතියට ඇතුළත්කර නොමැති බව දන්නේද;

(ii) එම තත්ත්වය යටතේ මූලික සැලැස්මේ සඳහන් පරිදි විදුලි ජනනයක් එකී ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කළ හැකිද;

(iii) ඉදිරියේදී මෙම සියලු ජල මූලාශ්‍රයන් හෝ ඉන් කොටසක් හෝ වැඩ අවසන් කර ඇති ඉහත ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ කාර්යක්‍ෂමතාව වැඩිකර ගැනීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, එසේ යොදා ගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රයන් කවරේද;

(v) අවශ්‍යතාවට අනුව ඉහත ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය හා බද්ධ කිරීමට හැකිවන අයුරින් එකී ජල මූලාශ්‍රවල අවශ්‍ය ඉදිකිරීම් කටයුතු කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4436/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, තිරිවානකැටියේ සිට අගලවත්ත දක්වා මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරන්නේද;

(ii) එසේ කාපට් කිරීමට නියමිත මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගිවිසුම් අත්සන් කර ඇති සමාගම් කවරේද;

(v) ගිවිසුමට අනුව එම මාර්ගයේ සංවර්ධන කටයුතු අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(vi) දැනට කාපට් අතුරා වැඩ අවසන් කර ඇති මුළු දුර ප්‍රමාණය කොපමණද;

(vii) වැඩ අවසන් කර ඇති ප්‍රමාණය එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) මේ වනවිට මෙම සමාගම් සඳහා ගෙවා ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?